---

රත්තොට ප්‍රාදේශීය සභාව

මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 18 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 04 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති රත්තොට ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). පල්ලේවෙරගම හා කයිකාවල ජල ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ ක්ලෝරීන් යන්ත්‍ර 02ක වටිනාකම වූ රු.130,000ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ). 2010 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදලින් ප්‍රජා ජල ව්‍යාපෘතියේ දායක මුදල් ලෙස මධ්‍යම පළාත් සභාව අඩුකරගෙන තිබූ රු.289,309ක් අදාල වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ප්‍රජා ජල ව්‍යාපෘතියෙන් අයවිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ). පර්චස්15.25ක බිම් ප්‍රමාණයකින් යුතු වරාහේනවත්ත ඉඩමේ වටිනාකමවූ රු.200,000ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 ජූනි 30 දින වන විට විගණන විමසුම් 17කට පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.60,303,514ක් විය.

(ආ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,838,781ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,017,065ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,564,372ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. ' 000 |
| (i). වරිපනම් හා බදු | 1,095 | 1,025 | 1,337 |
| (ii). බදු කුලී | 2,458 | 3,055 | 657 |
| (iii). බලපත්‍ර ගාස්තු | 727 | 871 | 271 |
| (iv). වෙනත් ආදායම් | 36,736 | 36,019 | 10,189 |

2.2.2 වරිපනම් හා අක්කර බදු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තියේ විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා අක්කර බදු ශේෂය පිළිවෙලින් රු.1,051,433ක් හා රු.285,149ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(2) වගන්තිය ප්‍රකාරව අදාල ප්‍රදේශවල සංවර්ධන මට්ටම සැළකිල්ලට ගෙන බදු නියම කරනු ලැබිය හැකි වුවත්, යොමුගත රෙගුලාසි සළකා බැලීමකින් තොරව 2004 වර්ෂයේදී අවසන්වරට වරිපනම් බදු ප්‍රතිශෝධනය කර සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 08ක් පමණ කාලයක් ගතවී ඇතත්, බදු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බදු කුලී

(අ). ගිවිසුමකට එළඹීමකින් හා කුලී අයකිරීමකින් තොරව, කම්බිඅඩියේ පිහිටි පැරණි පුස්තකාල ගොඩනැගිල්ල, කාන්තා සංවිධානයකට ලබාදී තිබූ බව 2012 දෙසැම්බර් 11 දින සිදුකරන ලද විගණන පරික්ෂණයකදී නිරීක්ෂණය විය.

(ආ) සභාව සතු රීප් ව්‍යාපෘති ගොඩනැගිල්ලේ කඩ කාමර බදු දීමේ ගිවිසුමේ 05 ඡේදයට අනුව ගිවිසුම්ගතවූ ව්‍යාපාර හැර වෙනත් කිසිදු ව්‍යාපාරයක් සිදු නොකළයුතු බව දක්වා තිබුණද, කඩ කාමර 06ක් එම කොන්දේසිය උල්ලංඝනය කර වෙනත් ව්‍යාපාර සිදු කරන බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරික්ෂණය විය. එසේම එම ගිවිසුමේ 18 ඡේදය ප්‍රකාර බදු ගැනුම්කරු විසින් තම කඩ කාමර හෝ එහි කොටසක භුක්තිය අන් අයෙකුට විකිණීම, පැවරීම, අතුරු බද්දක් වශයෙන් දීම බදු දීමනාකාර සභාවේ අවසරයක් නොමැතිව නොකළ යුතු වුවත්, එවැනි අවසරයකින් තොරව කඩකාමර 07ක බදු ගැනුම්කාර පාර්ශව විසින් අතුරු බදු දී තිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

2010 වර්ෂයට පෙර සිට පැවත එන වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟය වූ රු.271,226ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 3,631,104 |
| (ii). | මුද්දර ගාස්තු | 2,285,570 |

2.3 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාරවලට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට රු.677,500ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු.1,116,400ක් වූ භෞතික සම්පත් විෂයයන් 05ක් හා වටිනාකම ගණනය කර නොමැති විෂයයන් 02ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(1) වගන්තියට අනුව, තනතුරක් ඇති කිරීම හා වැටුප් නියම කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් 60දෙනෙකු දෛනික වැටුප් හා දීමනා ගෙවීමේ පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ රු.6,070,549ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි.

---

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) හා (ඕ) වගන්ති ප්‍රකාරව ප්‍රජා පිළිගැනීම් සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුත් යම් සිද්ධි හෝ අවස්ථා පිළිබඳ උත්සව පැවැත්වීම සම්බන්ධයෙන් හෝ යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අනුමැතිය මත එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000ක් නොඉක්මවන වියදම් දැරිය හැකි වුවද, අවස්ථා 23කට අදාලව රු.284,387ක වියදම් දැරීම සඳහා එපරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.6 අවිධිමත් ගනුදෙනු
---------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207,208 රීති හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:4, 3:4, හා 6:3 ඡේද අනුව තරඟකාරී මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කර, මිලදී ගැනීම කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව අත්මිල ගණන් ලබාගෙන අවස්ථා 12කදී රු.822,626ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 හා 24 වැනි වගන්ති අනුව ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත්කළ මාර්ග සඳහා සභා අරමුදල් යෙදවිය හැකි වුවත්, එවැනි ආකාරයේ සභාවට පවරා නොගත් පල්ලේයාය කොස්ගොල්ල අඩි පාර කොන්ක්‍රීට් කිරීම සඳහා සභා අරමුදල් යොදා රු.55,700ක ද්‍රව්‍ය ආධාර ලබාදී තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ සඳහන් විධිවිධාන පරිදි 2008 වර්ෂයේ සිට සභාවේ සේවයේ නියුතු දෛනික වැටුප් ලබන සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල වෙත සේව්‍ය/සේවක දායක මුදල් යැවීමට කටයුතු කර නොතිබුණි.

(ආ). මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාරව දෙන ලද අත්තිකාරම් අදාල කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත්, 1999 සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 10කදී සභාවේ කාර්යය මණ්ඩලය වෙත ලබාදී

-------------------------------------------------------------------------------------------------------------------------------------------------

තිබුණු රු.121,715ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). 2006 වර්ෂයේ නිලධාරින් විසින් ලබා නොගත් නිවාඩු වෙනුවෙන් ගෙවන ලද දිරි දීමනා රු.375,900ක් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියට අනුව ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත යම් ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයක විකුණනු ලබන අවස්ථාවක වෙන්දේසිකරු හෝ විකුණුම්කරු විසින් ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%ක බදු මුදලක් සභාව වෙත ගෙවිය යුතු වුවත්, අවස්ථා 03කදී කළ විකිණීම් වෙනුවෙන් රු.47,422ක බදු අඩුවෙන් අයකර තිබුණි.

(ඉ). 1954 අංක 53 දරන පනතින් සංශෝධනය වූ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ (199 වැනි අධිකාරය) 5 සහ 6(1) වැනි වගන්ති අනුව සැලසුම් අනුමත කළ නිවාස ඉදිකිරීමෙන් පසු, එම නිවාසවල පදිංචි වීමට පෙර අනුකූලතා සහතික නිකුත් කළයුතු වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2010,2011 හා 2012 වර්ෂවල අනුමත කළ ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍ර 272ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.

(ඊ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 214 රීතිය හා මු.රෙ.576 ප්‍රකාරව 2010, 2011 හා 2012 වර්ෂ වෙනුවෙන් තොග හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණ සිදුකර නොතිබුණි. එකී කාලපරිච්ඡේදය තුළ මිලදීගෙන හා ප්‍රදානයන් ලෙස සභාව වෙත ලැබී තිබූ රු.1,317,918ක් වටිනා භාණ්ඩ ඒකක 271ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(උ). 2006 වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලින් මන්ත්‍රීවරුන් සඳහා යතුරුපැදි මිලදී ගැනීම වෙනුවෙන් ලබාදුන් මුදලින් රු.22,873ක මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඌ). 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරින් 07 දෙනෙකුගෙන් 1998 වර්ෂයට පෙර සිට අයවිය යුතුව තිබූ රු.15,571ක හිඟ ණය

ශේෂය අයකර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට විගණන දිනය වූ 2013 අගෝස්තු 06 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(එ). සභාව සතු වාහන 07ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන සඳහා රු.1,506,604ක් වැයකර තිබුණද, ඊට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඵ) ඇළ මාර්ගයක කොන්ක්‍රීට් කුළුණු මත ඉදිකර තිබූ රීප් ගොඩනැගිල්ලේ කුළුණු ආශ්‍රිතව ඇළ මාර්ගය ආවරණය වනසේ කඩ කාමර 03ක් බදු ගැනුම්කරුවන් විසින් ඔවුන්ගේ පෞද්ගලික මුදලින් ඉදිකර ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන අතර, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු නීතිමය පියවරක් අනුගමනය කර නොතිබුණි

(ඔ). 2006 වර්ෂයේ සභාව වෙත ලැබී තිබුණු රු.175,000ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රය ගාස්තු අය කිරීමකින් තොරව අවිධිමත් ලෙස සභාපතිවරයා හා ජල පරිපාලකවරයා විසින් පෞද්ගලික කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණු අතර, එම යන්ත්‍රය සභාවට ආදායමක් ලබා ගැනීමට හැකි වන පරිදි යෙදවීමට සුදුසු වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.

(ඕ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(1) වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවක කිසිදු සභිකයෙකුට හෝ සේවකයෙකුට ප්‍රාදේශීය සභාව සමඟ ඇති කරන ලද හෝ ක්‍රියාවේ යොදවන ලද යම් ගිවිසුමක හෝ වැඩක සම්බන්ධතාවක් හෝ මූල්‍ය සම්බන්ධතාවක් වුවද, කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබිය යුතු වුවද, ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරීන් දෙදෙනෙකු හා සභිකයින් තිදෙනෙකු ප්‍රදේශයේ සමිති සමාගම්වල නිලතල දරමින් කොන්ත්‍රාත් ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සමඟ නීත්‍යානුකූල ගිවිසුම්වලට එළඹ කොන්ත්‍රාත් කටයුතු සිදු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.8,545,758ක් වටිනා කොන්ත්‍රාත් 12ක් සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ක). 2012 ජූලි 18 දින අංක CPHW-4166 දරන ට්‍රැක්ටරය සභාවේ කටයුතුවලට පරිබාහිර කටයුත්තක් සඳහා සභාපතිවරයා විසින් යොදවා ගනිමින් සිටියදී අනතුරකට ලක්වී අළුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට භාරදී තිබුණු අතර, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අලාභයට අදාල වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. 2012

---

ජූලි 26 දින කොළඹ ප්‍රදේශයෙන් අත්මිල ගණන් 03ක් ලබාගෙන එම ට්‍රැක්ටරය සඳහා එදිනම රු.71,140ක් වටිනා අමතර කොටස් මිලදීගෙන තිබුණි. ට්‍රැක්ටරය අළුත්වැඩියාව සඳහා අමතර කොටස් මිලදී ගැනීම හා අළුත්වැඩියා ගාස්තු වෙනුවෙන් රු.103,738ක් වැයකර තිබුණි. එසේම මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2002 ජූලි 25 දිනැති අංක සීපීසී/සීඑස්/9/4/1/6/55 දරන ලිපිය පරිදි වාහන අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට ප්‍රථම අදාල අළුත්වැඩියාව සතුටුදායක ලෙස කරගත් බවට මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් ලබාගත යුතු බවට අවධාරණය කර තිබියදීත් එවැනි වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ග). 2011 වර්ෂයේ ඉදිකළ කඩ කාමර 08කින් සමන්විත නිකලොය පාර සතිපොල අසල නව වෙළඳ සංකීර්ණයට යාබදව 10'x15' ප්‍රමාණයක ඇස්බැස්ටස් තහඩු යොදා හකුලන ඇලුමිනියම් දොරක් සහිතව කඩ කාමරයක් බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් ඉදි කර තිබුණු අතර, ඒ සම්බන්ධව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. සතිපොළ භූමියේ 30'x25'ක භූමි ප්‍රමාණයක් භාවිතා කර බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ වැඩපලක් ද අනවසරයෙන් පවත්වාගෙන යන බවද නිරීක්ෂණය විය. එසේම සභාවේ අනුමැතියකින් තොරව එකී ඉඩමට යාබදව 4'x25' ප්‍රමාණයේ ආරක්ෂක බැම්මක් අදාල බ්ලොක් ගල් ව්‍යාපාරයේ හිමිකරු විසින් ඉදි කර තිබුණු අතර, සභාව සතු භූමියක ගොඩනැගිලි ඉදිකිරීමේදී අදාල විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ඉදිකිරීම හා ව්‍යාපාර පවත්වා ගැනීමට ඉඩදීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සඳහන් උපදෙස් අනුව කළයුතු වුවත්, ඊට පටහැනිව කටයුතු කරමින් ඉහත කඩ කාමර හා භූමි ප්‍රමාණය සඳහා රු.1,500 බැගින් කුලී අය කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අභ්‍යන්තර පාලනය
(ඇ). අයවැය පාලනය
(ඈ). ආදායම් පරිපාලනය
(ඉ). ගබඩා පාලනය
(ඊ) ණයගැති හා ණයහිමි පාලනය